**ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය - 2020**

**--------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මතය**

**------**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**-------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

-------------------------------------------------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ----------------- | ----------------- | ------------------------------ | ------------ |
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 11.1 ඡේදය | සෑම මුදල් වර්ෂයකම ජනවාරි 31 දිනට පෙර සමාලෝචිත වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු භෞතිකව අවසන් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2021 අප්‍රේල් 09 දින දක්වාම අවසන් කර නොතිබුණි. | කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සේවා මුර ක්‍රමය යටතේ කාර්ය මණ්ඩලය කැඳවීම සීමාකර තිබූ අතර බාධක මධ්‍යයේ 2021 මැයි 10 දින වන විට නිමකිරීමට කටයුතු යොදා ඇත. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට පියවර ගැනීම. |
| (ආ) | 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනතේ 3(ආ), 3(ඇ), හා 3(ඈ) උපවගන්ති | ශ්‍රම අධ්‍යයන ආයතනය පිළිබඳ සඟරා, ජර්නල් සහ පොත් පළ කිරීම, සමීක්ෂණ වාර්තා නිකුත් කිරීම හා පුස්තකාල සහ තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම, ඒවා නඩත්තු කිරීම ආයතනයේ ප්‍රධාන අරමුණු වුවත් එම අරමුණු ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල ඉලක්කගත කණ්ඩායම් දැනුවත් කිරීමේ අරමුණින් "NILS News Letter" නමින් වාර ප්‍රකාශනයක් නිකුත් කර ඇත. තවද "පර්යේෂණ ප්‍රකාශන හා ව්‍යාපෘති" නමින් අංශයක් ස්ථාපිත කර වැඩසටහන් ක්‍රියාත්මක කරන අතර ශ්‍රම අධ්‍යනය ආයතනය වර්ෂයට අදාලව පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීමට කටයුතු කලද කොවිඩ් වසංගත තත්වය නිසා මෙම වැඩසටහන් ඵලදායී නොවේ. | පනතේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම කටයුතු කළයුතු වීම. |
| (ඇ) | 2020 අගෝස්තු 09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ I කොටස (i) ඡේදය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය කම්කරු විෂය පථයට ඇතුලත් වුවත්, 2010 අංක 12 දරන ජාතික ශ්‍රම අධ්‍යයන පනත, ක්‍රියාත්මක කලයුතු නීති සහ අණපනත් යටතේ සඳහන් කර නොතිබුණි. | ශ්‍රම අධයයන ආයතන පනත අදාල ආයතනික හා නෛතික රාමුව යටතේ ක්‍රියාත්මක කලයුතු නීති සහ අණපනත් යටතට ඇතුලත් කර දෙන ලෙස කම්කරු අමාත්‍යාංශය මගින් ජනාධිපති කාර්යාලයේ පැවති රැස්වීම්වලදී යෝජනාවක් කර ඇත. | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත කම්කරු අමාත්‍යාංශ විෂය පථයට ඇතුලත් කිරීමට කටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කලයුතු වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශ විගණනය සඳහා ඉදිරිපත් කිරීමේදී කාර්යය සාධන වාර්තාවක් ඉදිරිපත් කළ යුතු බවට උපදෙස් ලබා දී නොමැත. | ජාතික විගනන පනත අනුව කටයුතු කල යුතු වීම. |

**1.6 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනයේ මෙහෙයුම් කටයුතු සාර්ථකව පවත්වාගෙන යාම සඳහා රඳවා තබාගත යුතු බැංකු ශේෂය හඳුනාගෙන අතිරික්ත මුදල් කෙටිකාලීන ඉතුරුම් ක්‍රමයක ආයෝජනය කිරීමේ ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ සෑම මාසයක් අවසානයේම රු.මිලියන 5 සිට රු.මිලියන 21 ක් දක්වා ප්‍රමාණයන් බැංකු ජංගම ගිණුමේ ශේෂව පැවතුණි. එමගින් ආහතනයට උපයාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි. | පාලක මණ්ඩලය වෙත අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර මාසික වියදම දැරීමට ප්‍රමාණවත් මුදලක් ජංගම ගිණුමේ තබා ඉතිරිය ස්ථාවර තැන්පත් ගිණුමක තැන්පත් කිරීමට හෝ බැංකුව සමඟ සාකච්ඡා කර කෙටි කාලීන ආයෝජනවල යෙදීමට අනුමැතිය ලබා තිබුණද කොවිඩ් වසංගතය හේතුවෙන් ආදායම් බලාපොරොත්තු පරිදි නොලැබීම නිසා ද්‍රවශීලතාව ආරක්ෂා කිරීමට මුදල් ස්ථාවර තැන්පතුවල තැන්පත් කිරීමට නොහැකි විය. | අතිරික්ත බැංකු ශේෂය හඳුනාගෙන, කෙටිකාලීන ඉතුරුම් ක්‍රමයක ආයෝජනය කිරීමට ක්‍රියාමාර්ග ගැනීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.7,426,319 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.210,316 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7,636,635 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් ආයතනයට පාඨමාලා සහ වැඩසටහන් පැවැත්වීමට නොහැකිවීම නිසා පූර්ව වර්ෂයේ දී උපයන ලද රු. මිලියන 34.12 ක් වූ ආදායම් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 15.93 ක් දක්වා අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| ප්‍රධාන ආදායම්/ වියදම් අයිතමය | 2020 | 2019 | වෙනස | වෙනසේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|
| | (රු.) | (රු.) | (රු.) | (%) |
| ආදායම | 15,932,955 | 34,124,989 | (18,192,034) | (53) |
| රාජ්‍ය ප්‍රදාන | 6,100,000 | 10,768,853 | (4,668,853) | (43) |
| වැඩසටහන් පැවැත්වීම | 3,173,959 | 10,867,467 | (7,693,508) | (71) |
| අනිකුත් මෙහෙයුම් වියදම් | 26,285,315 | 33,876,058 | (7,530,853) | (22) |

පූර්ව වර්ෂයට සාපේක්ෂව, සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් හා රාජ්‍ය ප්‍රදාන ලැබීම් සියයට 48 කින් ද ප්‍රාග්ධන වියදම් සියයට 71 කින්ද පහත වැටී තිබූ බව නිරීක්ෂණය විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2001 වර්ෂයේදී කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක අධ්‍යාපන අංශය වෙත පරිත්‍යාග කර තිබූ වෑන් රථයක් 2008 වර්ෂයේදී සේවක අධ්‍යාපන අංශය කම්කරු දෙපාර්තමේන්තුවෙන් වෙන්ව ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ලෙස ස්ථාපිත කරන විට ආයතනයට භාරදී තිබුණද මෙම වාහනය ආයතනය වෙත විධිමත්ව පවරාගෙන නොතිබුණි. වාහනයේ කාර්මික දෝෂයක් හේතුවෙන් ධාවනයෙන් ඉවත්කර තිබූ නමුත් මෙම වාහනයේ ලියාපදිංචි අංකයට සමාන ලියාපදිංචි අංකයක් සහිතව පෞද්ගලික හිමිකරුවෙකු සතුව වෑන් රථයක් පවතින බව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් තහවුරු කර තිබූ අතර ආයතනය විසින් කොළඹ වංචා විමර්ශන කාර්යාංශය වෙත 2020 ජනවාරි 05 දින පැමිණිලි කිරීමෙන් පසු එම කාර්යාංශය විසින් අධිකරණ නියෝගයක් මගින් එම වාහනයට අදාල මුල් ගොනුව හා පැවරුම් ගොනුව කාර්යාංශය වෙත ඉදිරිපත් කරන ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්ට දන්වා තිබුණද 2020 දෙසැම්බර් 31 දිනටත් එම ගොනු ලබා නොදීම හේතුවෙන් පරීක්ෂණ කටයුතු නැවතී තිබුණි. | කොළඹ වංචා විමර්ශන අංශයට වාර්තා කිරීමෙන් පසු එහි මුල් ගොනුව හා පැවරීම් ගොනුව ලබාදෙන ලෙස මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත දන්වා නැවතත් ඉල්ලීමක් කලද තවම ලබාදී නැත. | මෙම විමර්ශන කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 45 දෙනෙකු වන අතර 2020 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 17 ක් එනම්, අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 38 ක් විය. මේ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 න් 06 ක් ම පුරප්පාඩුව පැවතුණි.. | කොවිඩ් වසංගතය හේතුවෙන් මූල්‍ය තත්වය අභියෝගයකට ලක්ව ඇති බැවින් අදාල සියලුම කාර්ය මණ්ඩල ඒ අයුරින්ම බඳවා ගැනීමට නොහැක. ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳව නැවත සමාලෝචනයක් සිදුකිරීම සඳහා කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අවශ්‍ය සංශෝධන සිදුකිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට අත්‍යවශ්‍ය වන කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීමට කටයුතු කල යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) 2020 ජූලි මාසයේදී ආයතනයේ පර්යේෂණ, ප්‍රකාශන හා ව්‍යාපෘති අංශයක් ස්ථාපිත කර තිබූ අතර එම අංශය සඳහා වැඩබලන සහකාර අධ්‍යක්ෂක පමණක් සිටින අතර වෙනත් කාර්ය මණ්ඩලයක් 2021 අප්‍රේල් 10 දිනටත් අනුයුක්ත කර නොතිබුණි. ඒ අනුව මෙම අංශය පිහිටුවීමේ අපේක්ෂිත අරමුණු ඉටු කිරීම ඉතා මන්දගාමී තත්ත්වයක පැවතුණි. | පවත්නා සීමිත මානව හා මූල්‍ය සම්පත් සැලකිල්ලට ගෙන උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කරමින් පවතී. අලුතින් බඳවා ගැනීම් සිදුකිරීම සඳහා පාලක මණ්ඩලය විසින් අනුමැතිය ලබාගෙන ඇති අතර වසංගත තත්වය සාමාන්‍ය තත්වයට පත්වූ පසුව ඉදිරියේදී බඳවා ගැනීමට කටයුතු කර ඇත. | ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට අත්‍යවශ්‍ය වන කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීමට කටයුතු කල යුතු වීම.. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අංශයේ සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන සහ පෞද්ගලික අංශයේ ආයතනික අවශ්‍යතා මත කාර්යමණ්ඩල බඳවා ගැනීමේ, කාර්යක්ෂමතා කඩඉම් සහ ඇගයීම් හා සේවා උසස් කිරීම සඳහා වූ විභාග, විභාග අංශය විසින් පවත්වනු ලැබේ. නමුත් ප්‍රශ්නපත්‍ර සැකසීම, පිළිතුරු පත්‍ර ඇගයීම මණ්ඩලයක් විසින් නොව එකම පුද්ගලයෙකු විසින් සිදුකරනු ලබන අතර මෙමගින් විභාග විෂමතාවයන් ඇතිවීමේ අවධානමක් පවතින බව නිරීක්ෂණය විය. තවද, විභාග පැවැත්වීම සම්බන්ධයෙන් ආයතනයේ පවතින අභ්‍යන්තර ක්‍රමවේදය දැක්වෙන ප්‍රවාහ සටහන් (Flow chart) ආදිය විගණනයේදී නිරීක්ෂණය නොවූ අතර පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම, රහස්‍යභාවය ආරක්ෂා කිරීම සම්බන්ධ පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම සඳහා සලසා ඇති පාලන ක්‍රම ආදියේ ප්‍රමාණවත් බව ඇගයීම සඳහා ප්‍රමාණවත් තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විශාග අංශයට අදාලව සම්පත් දායකයින් තෝරා ගැනීම, ගෙවීම් විධිමත්ව කිරීම සඳහා ක්‍රමවේදයක් හඳුන්වාදීමට ඇති පාලන ක්‍රම සඳහා පාලක මණ්ඩලය අනුමැතිය ලබාදී ඇති නමුත්, ඒ සඳහා විභාග අංශයේ කටයුතු විධිමත් කර ගුණාත්මක සේවාවක් සැපයීම අරමුණු කර ගෙන ඇත. විභාග විෂමතාවයන් ඇතිවීම වලක්වා ගැනීම, රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහාත් තවදුරටත් ක්‍රියාමාර්ග ගතයුතුව ඇත.<br>විභාග පැවැත්වීමේ අභ්‍යන්තර ක්‍රමවේද රහස්‍යභාවය ආරක්ෂා කිරීම් තොරතුරු විගණනය සඳහාද ඉදිරිපත් කිරීමට නොහැකි බව අවධාරණය කරමි. | පිළිගත් ආරක්ෂණ ක්‍රමවේද අනුගමනය කිරීම, රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා සලසා ඇති පාලන ක්‍රම ආදියේ තොරතුරු විගණනය වෙත ලබාදිය යුතුය. විගණනය රහස්‍යභාවය රැකීමට බැඳී සිටී. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2021 අප්‍රේල් 10 දිනටත් | මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. පාර්ලිමේන්තු සභා නායක | වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත |

| | | |
|---|---|---|
| පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | කාර්යාලය විසින් නිකුත් කර ඇති නව මාර්ගෝපදේශයන්ට අනුව සංයුක්ත තැටි (CD) ඉදිරිපත් කිරීම වෙනුවට මුද්‍රණය කරන ලද පිටපත් 300ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුව ඇති බව මෙම වසරේ මුල් භාගයේදී දන්වා ඇති බැවින් වාර්ෂික වාර්තා මුද්‍රණය සඳහා අළුතින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට සිදු විය. එම කටයුතු නිම කිරීමෙන් අනතුරුව, වාර්ෂික වාර්තාව කඩිනමින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු යොදා ඇත. එම ප්‍රමාදය සිදුවී ඇත්තේ ක්‍රමවේදය හදිසියේ සංශෝධනය වීම හේතුවෙනි. | කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |